(c) www.sinhalalyrics.com

අයන්න කියන්න ලොවටම ඇහෙන්න එන්න මගේ මල්ලි
දුවන්න පනින්න නටන්න ගයන්න එන්න මගේ නංගි

පාසල නම් රන් දෙවොලේ දෙවියන් වන් ගුරු කැලගේ
සිත දිනමින් පා සෙවනේ ශිල්ප ලබා මතු දවසේ
ලෝකය දකින්න එහි සැරි සරන්න එන්න මගේ මල්ලියේ

කාසි පනම් හිටි හැටියේ සතුරෝ ගෙන යති රහසේ
පොතින් පතින් ලද දැනුමේ ධනය සදාකල් සුරැකේ
ඥානය වඩන්න කාලය ගෙවන්න එන්න මගේ මල්ලී

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - මර්වින් පෙරේරා